**නියාගම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 03 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 08 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 17 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට නියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) වැඩිපුර ගෙවූ වැටුප් ගිණුමේ වූ රු.219,121 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ආ) ප්‍රාග්ධන ආධාර ලැබීම් රු.242,098 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**
**--------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.12,507,305 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂ සහ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.1,211,550 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
**-----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභා බලප්‍රදේශයේ සිදුකළ සංවර්ධන ව්‍යාපෘති සඳහා ලැබිය යුතු රු.7,498,134 ක ශේෂය සමාලෝචිත වර්ෂයේදීත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ රු.6,929,001 ක් වූ වියදම් ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂයේ දී රු.17,065,803 ක් දක්වා වර්ධනය වී තිබූ අතර, ඊට ඇතුළත් රු.15,954,942 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.96,231,342 ක් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන ද, එකතුව රු.244,741 ක් වූ පිරිවැටුම් බදු සහ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් උපලේඛන, රු.41,650 ක් වූ ඕවර්සියර්ගේ ක්ෂේත්‍ර ගබඩා සම්බන්ධව තොග ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 180 සිට 184 දක්වා | සභාවේ මුදල් හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ගෙන් සහ ආදායම් රැස් කිරීමේ කටයුතුවල නියැලෙන නිලධාරීන් 18 දෙනෙකුගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 570 සහ 571 | පොදු තැන්පතු ශේෂයට ඇතුළත්ව තිබුණු වසර 02 ක කාලයක් ඉක්මවන ලද රු.934,300 ක තැන්පතු ශේෂ 39 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.2,861,355 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.6,113,739 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,252,384 ක පසුබෑමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉකුත් වර්ෂවල තත්ත්වය සමඟ සමාලෝචිත වර්ෂයේ තත්ත්වය සැසඳීමේ දී ජංගම අනුපාතයේ සහ ක්ෂණික අනුපාතයේ පිරිහීමක් පෙන්නුම් කෙරෙන බව නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සහ ඉකුත් වර්ෂ වෙනුවෙන් අයකර ගත යුතුව තිබුණු රු.915,352 ක් වූ වරිපනම් බදු මුදලින් වර්ෂය තුළ අයකර ගෙන තිබුණේ රු.487,393 ක් හෙවත් සියයට 53 කි.

#### 2.3.2 බදු කුලී

වර්ෂය ආරම්භයට වූ රු.592,006 ක හිඟ කුලී ශේෂයෙන් වර්ෂය තුළ රු.99,380 ක් හෙවත් සියයට 17 ක් පමණක් අයවීම නිසා වර්ෂය අවසාන වනවිට හිඟය රු.492,626 ක් විය.

#### 2.3.3 මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.2,345,054 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු 11 ක පැවැති පුරප්පාඩු පුරවා ගැනීමටත්, අතිරික්ත තනතුරු 08 ක් විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් රු.30,896 ක මුදලක් අයවීමට තිබුණි.

(ඇ) සභාව විසින් පවත්වාගෙන යන බැංකු ජංගම ගිණුම් තුනක 2016 වසරේ එකතුව රු.18,023,710 ක මාසික සාමාන්‍ය ශේෂයක් පැවැති අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 131 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා අරමුදල්වලින් යම් කොටසක් ආයෝජනය කළහැකි වුවත්, ඊට අනුකූලව කටයුතු නොකිරීම නිසා උපයාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි.

**(ඈ) වත්කම් කළමනාකරණය**

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් භාවිතා කරන වාහන 04 ක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) සභාව විසින් භාවිතයට යොදවා ගන්නා ට්‍රැක්ටර් රථයකට අදාළ කිසිදු ලියවිල්ලක් සභාව සතුව නොතිබුණු අතර, ලියාපදිංචි අංකයක්ද නොතිබුණි.

(iii) සභාව විසින් දැනට භාවිතා නොකරන වාහන 03 ක් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

සභාවට අයත් වෙළඳපල සංකීර්ණ බදුදීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු.73,306 ක මුදලක් අයවිය යුතුව තිබුණි. එමෙන්ම කඩ කාමර 03 ක් සම්බන්ධව ගිවිසුම්ගත වීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සභා බලප්‍රදේශයේ කසළ බැහැර කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීමේ දී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කොම්පෝස්ට් ව්‍යාපෘතිය ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවය නිසා 2015 වර්ෂයේ ජුනි මස සිට නවතා දමා තිබූ අතර, කසළ අංගනයට 2016 වර්ෂයේ දී අකුණක් වැදීම නිසා ගොඩනැගිල්ලට සහ එහි සවිකර තිබුණු යන්ත්‍රසූත්‍ර වලට හානි සිදු වී තිබුණි.

(ආ) වර්තමානයේ සභා බලප්‍රදේශයේ එකතු වන කසළ වෙන්කිරීමකට ලක් කර, දිරන කසළ රු.5,000 ක මාසික කුලියක් ගෙවා පෞද්ගලික සමාගමකට අයත් වත්තකට බැහැර කර තිබුණි. නොදිරන ප්ලාස්ටික් සහ පොලිතීන් පෞද්ගලික ව්‍යාවසායකයකුට නොමිලේ ලබාදෙන අතර, ඉතිරි ඝණ අපද්‍රව්‍ය මළු තුළ බහා කොම්පෝස්ට් අංගනයේ කොටසක තැන්පත් කර තිබුණි.

(ඇ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් නිසි ව්‍යාපෘති සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

### 4.1 අයවැය පාලනය

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයක රු.433,265 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. වියදම් විෂයයන් 05 ක එකතුව රු.23,441,584 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, තවත් වියදම් විෂයයන් 02 ක අනුමත සීමාවන් ඉක්මවා රු.789,610 ක වියදම් දරා තිබුණි. ආදායම් විෂයයන් 07 ක ළඟාකර නොගත් ඉලක්කයන්ගේ එකතුව රු.22,076,846 ක් වීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

---

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/ 01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

---

2009 ජූනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

---

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණ අඩුපාඩු | (i) | ඇතැම් ආදායම් වැඩියෙන් හා අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. |
| | | (ii) | ජර්නල් සටහන් මුද්‍රණ දෝෂ සහිතව ඉදිරිපත් කර තිබුණි. |
| (ආ) | ස්ථාවර වත්කම් | (i) | වත්කම් පන්ති අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආදායම් රැස් කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | (ii) | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි. |
| | | (iii) | හිඟ මුද්දර ගාස්තු ආදායම් යාවත්කාලීනව අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 08 දෙනෙකුගේ අතිරික්තයක් පැවැතුණි. |
| | | (ii) | තනතුරු 11 ක පුරප්පාඩු පැවති නමුත්, ඒවා පිරවීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකිරීම් කර නොතිබුණි. |
| (ඉ) | වාහන පාලනය | (i) | සභාව සතු වාහන 05 ක ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| | | (ii) | භාවිතයට යොදවා නොගන්නා වාහන 03 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | වාහන 04 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | අයවැය පාලනය | (i) | වියදම් විෂයයක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. |
| | | (ii) | වියදම් විෂයයන් 05 ක ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, තවත් වියදම් විෂයයන් 02 ක සීමාව ඉක්මවා වියදම් දරා තිබුණි. |
| | | (iii) | ආදායම් විෂයයන් 07 ක ආදායම් ඉලක්ක ළඟා කරගෙන නොතිබුණි. |